# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2361/24 - 2023 දෙසැම්බර් මස 06 වැනි බදාදා - **2023.12.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/KGK/4/2(1)/2020/5/13.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/16/2020/UD/232.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙයියන්නේවෙල වසම (261) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, (කොට්ඨාස අංක 4, බහිරවකන්ද, මහනුවර මහ නගර සභා සීමාව තුළ) පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද 2023.06.27 දිනැති කැඩැස්තර සිතියම් අංක 320434 හි කලාප අංක 01හි පත්‍ර අංක 1 හි කැබලි අංක 1 වන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0058 ක් වූ පහත සඳහන් ඉඩම් කැබැල්ල :

01. කැබලි අංක **01**

ඉඩමේ නම: දුම්රිය මාර්ග රක්ෂිතය, වරිපනම් අංක 252/14, පේරාදෙණිය පාර; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0058.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 ජනවාරි මස 22 වැනි දින පෙ.ව. 11.00 ට මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 ජනවාරි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**යූ.ජේ.එම්.එස්.එස්.බී. ජයසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා ගඟවටකෝරළේ.

2023 දෙසැම්බර් මස 05 වැනි දින,
මහනුවර කඩවත් සතර හා ගඟවටකෝරළේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0059




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/HAR/4/2/1/52.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/12/2018/ WS/316.

2023 පෙබරවාරි මස 02 දිනැති අංක 2317/76 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 7 වැනි වගන්තිය දැන්වීම යටතේ සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2023 මැයි මස 24 වැනි දින පෙ.ව. 10.00ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි යනුවෙන් සඳහන් වී ඇත. එහි සඳහන් දිනය සහ වේලාව 2024.02.07 දින පෙ.ව. 10.00ට යනුවෙන් නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

**මොහාන් ධර්මදාස,**
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2023 නොවැම්බර් මස 29 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0061

---

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/PDB/4/3/2/23.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2020/ WS/49.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ අංක 2352/34 හා 2023.10.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III වන කොටසේ පළ කරන ලද හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2023.11.14 දින පෙ.ව. 10.00 සහ ලේඛන භාරදිය යුතු දිනය 2023.11.07 ලෙස සඳහන් වුවද, එම දිනයන්, හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2023.12.28 දින පෙ.ව. 10.00 සහ ලේඛන භාරදිය යුතු දිනය 2023.12.21 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ඩබ්. එම්.ටී.ඩී.කේ. වීරකෝන්,**
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2023 දෙසැම්බර් මස 04 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0062/1

---

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/PDB/4/3/2/21.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/12/2018/ WS/377.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ අංක 2352/34 හා 2023.10.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III වන කොටසේ පළ කරන ලද හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2023.11.16 දින පෙ.ව. 10.00 සහ ලේඛන භාරදිය යුතු දිනය 2023.11.09 ලෙස සඳහන් වුවද, එම දිනයන්, හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2023.12.28 දින පෙ.ව. 11.30 සහ ලේඛන භාරදිය යුතු දිනය 2023.12.21 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ඩබ්. එම්.ටී.ඩී.කේ. වීරකෝන්,**
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2023 දෙසැම්බර් මස 04 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0062/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.